විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

**வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு**

**MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM**

---

**මාධ්‍ය නිවේදනය**

# මහනුවර ඇසළ පෙරහැර නැරඹීමට සහ ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් අත්විඳ ගැනීමට රාජ්‍යතාන්ත්‍රික බලකාය එක් වේ

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, මහනුවර ශ්‍රී දළදා මාලිගාව සමඟ එක්ව, රාජ්‍යතාන්ත්‍රික බලකායේ නිලධාරීන් සඳහා 2026 අගෝස්තු 26 වැනි දින සිට 28 වැනි දින දක්වා මහනුවර නගරය වෙත විශේෂ සංචාරයක් සංවිධානය කළේය. එමඟින් ඔවුන්ට මහනුවර ඇසළ පෙරහැර නැරඹීමට සහ ශ්‍රී ලංකාවේ පොහොසත් ආගමික හා සංස්කෘතික උරුමයන් අත්විඳීමට අවස්ථාවක් සැලසුණි.

කොළඹ පදනම් කරගත් දූත මණ්ඩල ප්‍රධානීන්, නවදිල්ලි නුවර සිටින, ශ්‍රී ලංකාව වෙත සමගාමී ප්‍රතීතනය ලත් දූත මණ්ඩල ප්‍රධානීන්, ඔවුන්ගේ කලත්‍රයන් සහ අනෙකුත් රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ගෙන් සමන්විත වූ රාජ්‍යතාන්ත්‍රික බලකායේ සාමාජිකයින් 70දෙනෙකු පමණ මෙම තෙදින වැඩසටහනට සහභාගී වූහ.

මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ උසස් අධ්‍යාපන ආයතනය වන පල්ලෙකැලේ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය (SIBA කැම්පස්) නැරඹීමෙන් මෙම වැඩසටහන ආරම්භ විය. එහිදී බෞද්ධ දෘෂ්ටිය සහ උරුමය ආරක්ෂා කිරීම සඳහා ඇකඩමිය විසින් සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පැමිණි රාජ්‍යතාන්ත්‍රිකයින්ට අවස්ථාව සැලසුණි. මහනුවර ඇසළ පෙරහැරේ, ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනකට ද රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සහභාගී විය. පැවැති සංස්කෘතික වැඩසටහනකින් අනතුරුව, ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේවරයා විසින් සංවිධානය කර තිබූ සාම්ප්‍රදායික රාත්‍රී භෝජන සංග්‍රහයක් ද පැවැත්විණි. එමඟින්, සහභාගී වූ පිරිසට, මහනුවර යුගයේ සම්ප්‍රදායන් සහ ආගන්තුක සත්කාරයේ ආභාෂය පිළිබඳ අත්දැකීමක් ලබා ගැනීමට හැකි විය.

රාජ්‍යතාන්ත්‍රික බලකාය, අගෝස්තු 27 වැනි දින, ශ්‍රී දළදා මාලිගාව වෙත සංචාරයක නිරත වූ අතර, එහිදී ඔවුහු සාම්ප්‍රදායික තේවාව දැක බලා ගත්හ. දූත පිරිස, ජාත්‍යන්තර බෞද්ධ කෞතුකාගාරය, ඇත් ගාල් සහ ඇහැලේපොළ වලව්ව ඇතුළු ශ්‍රී දළදා මාලිගාව සහ මහනුවර ආශ්‍රිත ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථාන ද නැරඹීය.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් ඇහැලේපොළ වලව්වේ දී සාම්ප්‍රදායික දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලද අතර, එමඟින් සංචාරක රාජ්‍යතාන්ත්‍රිකයින්ට ශ්‍රී ලංකා සූපශාස්ත්‍ර සම්ප්‍රදායන් සහ ආගන්තුක සත්කාරය අත්විඳීමට තවදුරටත් අවස්ථාව සැලසුණි.


| | | | |
|---|---|---|---|
| **Foreign Affairs**<br>විදේශ කටයුතු<br>வெளிநாட்டு அலுவல்கள் | **Republic Building, Colombo 1**<br>ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1<br>குடியரசுக் கட்டிடம், கொழும்பு 1 | 2 325 373/5, 2 207 200/7 | cypher@mfa.gov.lk |
| **Foreign Employment**<br>විදේශ රැකියා<br>வெளிநாட்டு வேலைவாய்ப்பு | **17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**<br>17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5<br>17 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5 | 2 331 200 | info@mfe.gov.lk |
| **Tourism**<br>සංචාරක<br>சுற்றுலாத்துறை | **No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**<br>අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1<br>இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1 | 2 381 798, 2 321 222 | secretary@tourismmin.gov.lk |

ශ්‍රී ලංකාවේ වඩාත්ම වැදගත් ආගමික හා සංස්කෘතික සංදර්ශනවලින් එකක් වන මහා රන්දෝලි පෙරහැර නැරඹීම සංචාරයේ කැපී පෙනෙන සිදුවීමක් විය. ශ්‍රී දළදා මාලිගාව සහ මහනුවර රාජධානිය හා සම්බන්ධ සියවස් ගණනාවක් පැරණි සම්ප්‍රදායන් පිළිබිඹු කරමින් සාම්ප්‍රදායික නර්තන ශිල්පීන්, බෙර වාදකයින්, රංගන ශිල්පීන් සහ අලි ඇතුන් ඇතුළත් පෙරහැරේ උත්කර්ෂවත් බව, පැමිණි රාජ්‍යතාන්ත්‍රිකයින් අත්විඳි ගත්හ.

නියෝජිත පිරිසට පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ වැදගත්කම පිළිබඳ කෙටි විස්තරයක් ලබාදුන් එහි සංචාරයක් ද ඇතුලත් වූ අතර, ලංකා තේ වල ඉතිහාසය සහ උරුමය පිළිබඳව හඳුන්වා දුන්, හන්තාන හි පිහිටි ලංකා තේ කෞතුකාගාරය වෙත සිදුකළ සංචාරයක් ද මෙම වැඩසටහනට ඇතුලත් විය.

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින්, ශ්‍රී ලංකාව වෙත ප්‍රතීතනය ලත් රාජ්‍යතාන්ත්‍රික බලකාය සම්බන්ධ කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගන්නා අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස මෙම සංචාරය සංවිධානය කෙරිණි. විදේශීය නියෝජිතයින්ට, රටේ ආගමික සම්ප්‍රදායන්, සංස්කෘතික උරුමයන්, ආහාරපාන සහ සංචාරක ආකර්ෂණයන් ප්‍රථම වරට අත්විඳීමට ලැබුණු අවස්ථාව මගින්, සුවිශේෂ හා විවිධ සංස්කෘතික අනන්‍යතාවයන් සහිත ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ දෘශ්‍යතාව තවදුරටත් වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**

**කොළඹ 01**

**2026 සැප්තැම්බර් 02 වැනි දින**